සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**දේශපාලන විද්‍යාව I**

**Political science I**

23 S I

පැය 02

**Time:02 hours**

සැළකිය යුතුයි

- ★ මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- ★ A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- ★ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතු ය.
- ★ එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 100 කි.

## A කොටස

- අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01 දේශපාලන විද්‍යාව,
1. නව යුගයේ ආරම්භයත් සමග පහළ වූ ශාස්ත්‍රීය ශික්ෂණයකි.
2. ආණ්ඩුවේ ක්‍රියාදාමයන් පමණක් හැදෑරීමට සීමා වූවකි.
3. න්‍යාය සංකල්ප සහ විධික්‍රමවල ඒකීයත්වය මූලික ලක්ෂණයයි.
4. අධ්‍යයනය සඳහා ප්‍රතිමානීය ප්‍රවේශ මෙන්ම විද්‍යාත්මක ප්‍රවේශ ද භාවිතා කරනු ලබයි.
5. අනෙකුත් සමාජීය විද්‍යාවන් සමග සම්බන්ධ නොවන ස්වාධීන විෂයක් ලෙස සැලකේ. (............)

02 දේශපාලනය,
1. ගැටුම්කාරී හැසිරීම් වලට භාවිතා කරන පර්යාය පදයකි.
2. රාජ්‍යයට හා රාජ්‍ය පරිපාලනයට සීමා වූ ක්‍රියාවලියකි.
3. පවුල වැනි ක්ෂුද්‍ර මට්ටමේ සංවිධානවල සිට ගෝලීය මට්ටමේ සංවිධාන දක්වා පැතිරුණ ක්‍රියාවලියකි.
4. තනි තනි පුද්ගලයන්ගේ ක්‍රියාකාරකමකි.
5. සියළු දෙනාම පිළිගන්නා ආකාරයට සමාජ පොදු යහපත සමග බැඳී ඇති ක්‍රියාවලියකි. (............)

03 දාර්ශනික අධ්‍යයන ක්‍රමයට අදාළ වන්නේ,
1. දැනට පවතින ලෝකය පිළිබඳ කරනු ලබන විග්‍රහයකට සීමාවේ.
2. අනාගත අපේක්ෂාවන්ගෙන් සහ වටිනාකම් නිශ්චයන්ගෙන් වියුක්තය.
3. ලෝකය පිළිබඳ හා දේශපාලනය පිළිබඳ ඇති මූලික ප්‍රශ්න අසනු ලබයි.
4. ආනුභවික ක්‍රමවේදය මත පදනම් වේ.
5. වාස්තවික දැනුම ගොඩනගනු ලබයි. (............)

04 දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය,

1 නිෂ්පාදන ශිල්ප ක්‍රමය සමාජ සැකැස්මේ මූලික ස්වභාවය තීරණය කරන බව අවධාරණය කරයි.
2 දේශපාලන බලයත් ආර්ථික බලයත් එකිනෙකට සතුරු පන්ති අත පවතින බව පිළිගනී.
3 සමාජය සමස්තයක් ලෙස අධ්‍යයනය කරනවා වෙනුවට වෙන් වෙන්ව එහි පැතිකඩ අධ්‍යයනය කළ යුතු බව පෙන්වා දෙයි
4 ආර්ථික, සමාජ සහ දේශපාලන පරිවර්තනයේ මූලික ගතිකත්වය වන්නේ සමාජ සාමය බව පිළිගනියි.
5 චර්යාවාදී අධ්‍යයන ප්‍රවේශයේ මූලික හරයන් ආරක්ෂා කරනු ලබයි. (............)

05 දේශපාලන මතවාදයක ස්වභාවය වන්නේ,

1 එකිනෙකට පරස්පර අදහස්වලින් යුක්ත වේ.
2 භාවිතයෙන් තොර න්‍යාය සහ සංකල්පවල එකතුවක් වේ.
3 සමාජ කොටස්වල අධ්‍යාත්මික වර්ධනය ප්‍රධානම ඉලක්කය වේ.
4 ක්‍රියාකාරී දේශපාලනයට මග පෙන්වන්නක් නොවේ.
5 සමාජ කණ්ඩායම්වල දේශපාලන විඥාණය, විශ්වාසය සහ ඉදිරි දැක්ම හැඩ ගැසීමට බලපානු ලැබේ.(............)

06 රාජ්‍යය යනු,

1 ආණ්ඩුවේ සේවකයා වේ.
2 ඓතිහාසිකව වෙනස් නොවූ දේශපාලන සංස්ථාවක් වේ.
3 ගෝලීයකරණය විසින් ශක්තිමත් කර තිබේ.
4 සාධක සංයුතිය අතින් විවිධ වේ.
5 දැකිය නොහැකි ස්පර්ශ කල නොහැකි සමාජයේ සෑම තැනකම පවතින ප්‍රපංචයක් වේ. (............)

07 සංඝීය ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ ,

1 බලය මධ්‍යගත වීමයි.
2 ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක පැවැත්මයි.
3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේ බලය සහිත අධිකරණයක පැවැත්මයි.
4 මධ්‍යයට යටත් පර්යන්ත ඒකක පැවතීමයි.
5 විකාශනාත්මක ආණ්ඩුක්‍රම මාදිලියක් වීමයි. (............)

08 සමාජ සම්මුතිවාදී චින්තකයෙකු වන ජෝන් ලොක්ගේ දර්ශනයේ එක් මූලික හරයක් වන්නේ,

1 රාජ්‍යයට බලය දෙවියන් වහන්සේගෙන් ලැබී ඇත.
2 පාලකයන්ට හිමිවන්නේ කොන්දේසි සහිතව ලබා දී ඇති භාරකාරත්ව බලයකි.
3 පාලකයා ඉවත් කිරීමට ජනතාවට අයිතියක් නොමැත.
4 රජුගේ බලය පරමාධිකාරී වන අතර එය ප්‍රශ්න නොකළ යුතුය.
5 මිනිසුන් ස්වභාවයෙන්ම කෲර ආත්මාර්ථකාමී පිරිසක් වන්නේය. (............)

09 පැසිස්වාදයට අදාළ ලක්ෂණයක් නොවන්නේ,

1 සමාජ සමානාත්මතාවය පිළිගැනීමයි.
2 දේශපාලන ඒකබලවාදය පිළිගැනීමයි.
3 රාජ්‍යය පූජනීය ලෙස සැලකීමයි.
4 නායකයා වන්දනාමාන කිරීමයි.
5 අත්‍යයන්ත වර්ගවාදය මත යැපීමයි. (............)

10 ස්ත්‍රීවාදයට අදාළ නොවන්නේ,

1 කාන්තාවන්ට ඡන්ද බලය ලබා ගැනීමට ඇරඹි ව්‍යාපෘතිය ස්ත්‍රීවාදයේ පළමු ධාරාව ලෙස සැලකිය හැකිය.
2 ස්ත්‍රීවාදීන් විවිධ දේශපාලන න්‍යායන්ගෙන් ආභාෂය ලබා ඇත.
3 ඔවුන්ගේ මූලික අවධාරණය වන්නේ සමාජය පීතෘ මූලික වන බවයි.
4 ධනවාදයේ හා තාක්ෂණයේ දියුණුව විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතා අවසන් වන බව පිළිගනු ලබයි.
5 රැඩිකල් ස්ත්‍රීවාදය ලිංගික විප්ලවයක අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි. (............)

11 සිවිල් සමාජය,

1 සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථයට අනුව සිවිල් සමාජය යනු ධනවාදී වෙළඳපොළය.
2 රාජ්‍ය හා දේශපාලන පක්ෂ සමග බද්ධ වූ සමාජ දේශපාලන අවකාශයක් ලෙස හඳුන්වයි.
3 ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට සිවිල් සමාජය බාධාවක් වෙයි.
4 තම අරමුණු ඉටු කර ගත් විට විසිරී යන සමාජ සංවිධානයක් ලෙස හඳුන්වයි.
5 දේශපාලන සදාචාරයට පටහැනිව කටයුතු කරනු ලබන පුද්ගල සංවිධානයක් ලෙස සලකයි. (............)

12 නව ලිබරල්වාදී රාජ්‍ය,

1 රාජ්‍ය සුභසාධන සංකල්පය තුළින් ආරම්භ විය.
2 රාජ්‍ය ආර්ථික කටයුතුවලට අනිවාර්යයෙන්ම මැදිහත් වේ.
3 මූලික අයිතිවාසිකම් රාජ්‍ය මගින් ලබා දී ඇති බව පිළිගනු ලබයි.
4 පුද්ගලයාගේ දේශපාලන අයිතිවාසිකම් ලබාදීම සඳහා රාජ්‍ය බලය උපරිමයෙන් ක්‍රියාත්මක කළ යුතු බව පිළිගනියි.
5 ලිබරල් රාජ්‍ය වූ කලී ආණ්ඩු පාලනයට පමණක් සීමා කළ යුතු බව ඔවුන් පිළිගනියි. (............)

13 සමාජවාදී රාජ්‍ය,

1 එමගින් පෞද්ගලික දේපල අයිතිය සුරක්ෂිත කරයි.
2 සමාජවාදී යුගයේ දී පන්ති සටන අහෝසි වී යන බව ප්‍රකාශ කරයි.
3 වෙළඳපොල ආර්ථිකයක ක්‍රියාත්මක කරනු බව ප්‍රකාශ කරයි.
4 බහු පක්ෂ ක්‍රමයක් මත පදනම් වූ දේශපාලන ක්‍රමයක් පවතින බව ප්‍රකාශ කරයි.
5 රාජ්‍ය ආධිපත්‍ය වෙනුවට පෞද්ගලික ව්‍යවසාය ස්ථාපනය කරයි. (............)

14 පැසිස්ට්වාදී රාජ්‍ය,

1 පුද්ගලයා නොව රාජ්‍ය උත්තරීතර බව පිළිගනු ලබයි.
2 රාජ්‍යයේ බලය සීමිත වේ.
3 රාජ්‍යයේ උපත, ස්වභාවය හා අනාගතය සම්බන්ධව ක්‍රමානුකූල විග්‍රහයන් සිදු කරයි.
4 ජනමාධ්‍ය නිදහස උපරිම ලෙස ආරක්ෂා කරනු ලබයි.
5 ජනතාව දේශපාලනික වශයෙන් ඉහළ සහභාගීත්වයක් දරයි. (............)

15 ස්වාධිපත්‍ය,

1 ස්වාධිපත්‍ය බලය අන්සතු කළ නොහැක.
2 රාජ්‍ය තුළ පුරවැසි අවනතභාවය ලබා ගැනීම බාහිර ස්වාධිපත්‍ය ලෙස හඳුන්වයි.
3 වෙනත් ඕනෑම ස්වාධිපත්‍ය බලයකට යටත් නොවීම අභ්‍යන්තර ස්වාධිපත්‍ය වේ.
4 රාජ්‍ය සතු උත්තරීතර බලය ස්වාධිපත්‍ය ලෙස අදහස් කෙරේ.
5 ස්වාධිපත්‍යය අභියෝගයට ලක් නොවීමට එක් හේතුවක් වන්නේ ගෝලීයකරණයයි. (............)

16 නිරාගමිකවාදය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 දේශපාලනය හා ආගම එකට බද්ධ වේ.
2 රාජ්‍ය ක්ෂේත්‍රයට ආගමික බලපෑම් එල්ල කළ හැකිය.
3 රාජ්‍යයේ පැවතීම තීරණය කළ යුත්තේ ආගමික සංවිධාන විසිනි.
4 රාජ්‍ය කිසිම ආගමකට පක්ෂපාතීව කටයුතු නොකළ යුතු බව අවධාරණය කරයි.
5 දේශපාලන ප්‍රතිපත්ති සැකසීමේ දි ආගමික මතවාදයන්ට ප්‍රමුඛස්ථානය දිය යුතුය. (............)

17 ලිබරල්වාදය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 නව ලිබරල්වාදය තුළින් නිර්බාධවාදී රාජ්‍ය සංකල්පය ඉදිරිපත් කරන ලදී.

2 පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදය තුළින් සුභසාධන රාජ්‍ය සංකල්පය ඉදිරිපත් කරන ලදී.

3 සම්භාව්‍ය ලිබරල්වාදය තුළින් අවම රාජ්‍ය සංකල්පය ඉදිරිපත් කරන ලදී.

4 පොදු දේපල අයිතිය එහි මූලික අංග ලක්ෂණයකි.

5 නිදහස් මතවාදයන් පැතිරවීමට ඉඩක් ලිබරල්වාදය තුළ නැත. (............)

18 සන්ධීය ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් අදාල වන්නේ,

1 තනි රාජ්‍යයක් තුළ ආණ්ඩු අතර පරිපාලන බලය සම්බන්ධීකරණය කිරීමේ ක්‍රමයකි.

2 පාර්ලිමේන්තු පනතක් මගින් බලය විමධ්‍යගත කොට ඇත.

3 ව්‍යවස්ථාදායකය බොහෝ විට ඒකමාණ්ඩලීය වේ.

4 කුඩා රාජ්‍යයන්වලට වඩාත් උචිත වේ.

5 එක්සත්කම සහ ප්‍රාදේශීය විවිධත්වය අතර සම්මුතියක් මත සන්ධීය ක්‍රමය පදනම් වේ. (............)

19 ගැටුම් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 ගැටුම් වර්ගීකරණයට භාජනය නොවේ.

2 ගැටුම්වල ඇත්තේ නිශේධනීය පැතිකඩක් පමණි.

3 එකිනෙකට නොපෑහෙන අරමුණු මත ගැටුම් හට ගනියි.

4 ගැටුම් ඇතිවීමට දේශපාලන බලය බලපාන්නේ නැත.

5 ගැටුම් කෙළවර කළ යුත්තේ යුද්ධයන් මගින් පමණි. (............)

20 නිදහස් ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,

1 කෘෘව් මැකලම්   2 මැනිං ඩෙවොන්ෂයර්

3 ඩොනමෝර්   4 සෝල්බරි

5 කෝල්බෲක් කැමරන් (............)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21 යටත් විජිත රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A- යුරෝපීය නොවන රාජ්‍යයන් තුළ වර්ධනය විය.

B- 1815 දී ශ්‍රී ලංකාව මුළුමනින්ම යටත් විජිතයක් බවට පත් විය.

C- මිලිටරි නිලධාරිවාදී රාජ්‍ය වශයෙන් ගොඩනැගුණි

D- නීතියේ ආධිපත්‍ය පූර්ණව ක්‍රියාත්මක කරන ලදී.

E- මව් රාජ්‍යයේ ආධිපත්‍යයට යටත් විය.

1) A B C D   2) B C D E   3) A B D E   4) A C D E   5) A B C E (............)

22 රාජ්‍ය හා පුරවැසියා සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A- පුරවැසියන් පොදු තීරණ ගැනීමට නියෝජිතයන් මගින් සම්බන්ධ වන වගකිව යුතු නිලධාරීන් වේ.

B- රාජ්‍ය විසින් පුරවැසියන්ට දේශපාලන අයිතිවාසිකම් ලබාදෙයි.

C- පුරවැසියන් ද රාජයයට දේශපාලන වගකීම් ඉටු කිරීමට බැඳී සිටියි.

D- රාජ්‍යයට කිසිවිටක පුරවැසිභාවය අහිමි කළ නොහැක.

E- රාජ්‍ය විසින් පුරවැසියාට ආරක්ෂාව හා සමාජ ආරක්ෂාව සපයයි.

1) A B C D 2) B C D E 3) A B D E 4) A C D E 5) A B C E (............)

23 මාක්ස්වාදය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A- ආර්ථික සාධකය මුල් කර ගනිමින් ඉදිරිපත් වූ දර්ශනයකි.

B- එය පන්ති සටන්වල ඉතිහාසයකි.

C- එහි පදනම රාජ්‍ය පන්තියක ආයුධයක් ලෙස ක්‍රියාත්මක වන බවයි.

D- අවසානයේ රාජ්‍ය වර්ධනය වන බව පවසයි.

E- සමාජවාදී යුගය කම්කරු පන්තියෙන් බිහිවන බව ප්‍රකාශ කරයි.

1) A B C D 2) B C D E 3) A B D E 4) A C D E 5) A B C E (............)

24 ඒකීය ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A- ස්වාධිපත්‍ය අනෙකුත් ආයතනවලට පවරා දෙයි.

B- ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය මධ්‍යම ආණ්ඩුව සතුය.

C- සිය අභිමතය පරිදි ප්‍රාදේශීය ආයතන හසුරවනු ලබයි.

D- එය සංකීර්ණ නොවූ කාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයකි.

E- ඒකමණ්ඩලවාදය මත පදනම් වේ.

1) A B C D 2) B C D E 3) A B D E 4) A C D E 5) A B C E (............)

25 ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A- ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයට එක් විකල්පයක් ලෙස බිහි විය.

B- විධායකය හා ව්‍යවස්ථාදායකය වෙන් වෙන්ව තෝරා ගනියි.

C- ජනාධිපති රාජය නායකයා වුව ද ආණ්ඩුවේ නායකයා නොවේ.

D- විධායක අධිකාරීත්වය ජනාධිපතිවරයා සතු වේ.

E- විධායකය ව්‍යවස්ථාදායකට වග නොකියයි.

1) A B C D 2) B C D E 3) A B D E 4) A C D E 5) A B C E (............)

- **පහත වගුව පදනම් කරගෙන 26 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න, වගුවේ වම් කොටසේ දක්වා ඇති එක් එක් න්‍යායට ගැළපෙන අංග ලක්ෂණ කිහිපයක් වගුවේ දකුණු කොටසේ දක්වා ඇත.**

| **රාජ්‍ය පිළිබඳ න්‍යාය** | **අංග ලක්ෂණ** |
|---|---|
| ලිබරල්<br><br><br><br>සමාජවාදී<br><br><br>පැසිස්ට් | A- රාජ්‍යය අවසානයේ දී වියලී යන්නේය.<br>B- රාජ්‍ය වූ කලී පොදු යහපත උදෙසා ගොඩනැගූ සමාජ සංවිධානයක් වේ.<br>C- පුද්ගල නිදහස උත්තරීතර වේ.<br><br>D- සමානාත්මතාව පිළිබඳ අදහස පිළිනොගනී.<br>E- රාජ්‍ය පංති ආයුධයක් වේ.<br>F- පුද්ගලයන් රාජ්‍යයේ අවශ්‍යතාවට අනුව ක්‍රියාත්මක කළ යුතු වේ.<br>G- රාජ්‍ය සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් වේ.<br>H- රාජ්‍යය සහ ජාතිය උත්තරීතර කොට සලකයි.<br>I- හැකියාවට අනුව හැමදෙනාගෙන්ම අවශ්‍යතාවන්ට අනුව හැමදෙනාටම. |

26 රාජ්‍ය පිළිබඳ ලිබරල් න්‍යායට අදාළ වන්නේ කුමන ලක්ෂණ අන්තර්ගත කාණ්ඩය ද?

1) ABC  2) DEF  3) GHA  4) GBC (............)

27 රාජ්‍ය පිළිබඳ සමාජවාදී න්‍යායට අදාළ වන්නේ කුමන අංග ලක්ෂණ අන්තර්ගත කාණ්ඩය ද?

1) ABC  2) BCD  3) AEI  4) GHI (............)

28 රාජ්‍ය පිළිබඳ පැසිස්ට් න්‍යායට අදාළ වන්නේ කුමන අංග ලක්ෂණ ද?

1) CHD  2) DFG  3) DFH  4) ADF (............)

29 ලිබරල්වාදය සබන්ධයෙන්,

A- ලිබරල්වාදයේ නැගීම හා ධනවාදයේ වර්ධනය එකිනෙකට සම්බන්ධ වේ.
B- ලිබරල්වාදය තුළ පුද්ගලයාට නිදහස හිමි වේ.
C- ලිබරල්වාදය ශක්තිමත් ආණ්ඩුවකට පක්ෂපාතී වේ.
D- අදහස් මාලාවක් වශයෙන් ලිබරල්වාදය කාලයත් සමග වෙනස්කම්වලට ලක්වී ඇත.
E- දේශපාලන නිදහසට වඩා ආර්ථික සමානාත්මතාව කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි.

1) A B C D  2) B C D E  3) C D E A  4) D E A B  5) EA B C (............)

30 පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් රාජ්‍ය පිළිබඳ මුල්කාලීන ලිබරල් න්‍යායට ඉතාම අඩුවෙන් අදාළ වන්නේ කවර ප්‍රකාශය ද?

1 හොඳම රාජ්‍යය අඩුවෙන්ම ආණ්ඩු කරන රාජ්‍යයයි.
2 රාජ්‍යය විසින් මිනිසුන්ට ඔවුන්ගේ කාර්යයන් සංවිධානය කරගැනීමට ඉඩදිය යුතුය.
3 රාජ්‍ය ආයෝජනය කළ යුත්තේ ක්ෂණිකව ප්‍රතිඵල සහතික කළ ව්‍යාපෘතිවලය.
4 නීතිය හා සාමය ඇති කිරීම රාජ්‍යයේ වගකීමයි.
5 පුද්ගලයාට සිය දියුණුව අත්පත් කර ගැනීමේ සහජ හැකියාවක් පවතියි. (............)

## B-කොටස

31 දේශපාලනය කිරීමට අදාළ වන්නා වූ ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

32 දේශපාලනය හැදෑරීමට අදාළ වන්නා වූ ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

33 දේශපාලන ආයතන දෙකක් නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

34 දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ දෙකක් නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

35 නිකොමාකියානු ආචාර ධර්ම හා ජනරජය (සමූහාණ්ඩු) කෘතිය සම්පාදනය කරනු ලැබූ චින්තකයින් දෙදෙනා නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

36 20 වන සියවස තුළ දී දේශපාලන විද්‍යාව ඉතා සමීප සම්බන්ධතාවයන් පවත්වා ගෙන යනු ලැබූ සමාජ විද්‍යාවන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

37 දේශපාලන පක්ෂවල කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

38 බලපෑම් කණ්ඩායම් හඳුන්වා වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

39 තුලනාත්මක දේශපාලන අධ්‍යයනයේ නිරත වූ චින්තකයන් දෙදෙනෙකු සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

40 නූතන භෞතික රාජ්‍ය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධානගත කොට තිබේ. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

41 ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලික අංග ලක්ෂණ දෙකක් නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

42 ස්වාධිපත්‍යය ප්‍රධාන පැතිකඩ දෙකකින් සමන්විත වේ. ඒවා නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

43 සමාජවාදීන් අවධාරණය කරන පරිදි මිනිසා විසින් පසු කරනු ලැබූ යුග ගණනාවකි. ඉන් දෙකක් සඳහන් කරන්න

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

44 ලිබරල් වාදය ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනාගත හැකිය. ඒවායින් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

45 සංධීය රාජ්‍යයන් බිහිවීමට බලපෑම් කරන හේතු සාධක දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

46 සහ සන්ධීය ආණ්ඩු ක්‍රමයකට දිය හැකි හොඳම නිදසුන් දෙකක් සපයන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

47 ජනාධිපති ආණ්ඩු ක්‍රමයක වාසි දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

48 ගැටුම් තුන් ආකාරයකින් වර්ගීකරණය කළ හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

49 ගැටුම් සමස්ත ක්‍රියාවලියේ දී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍ය 4 කි ඉන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

50 මහාචාර්ය යොහාන් ගැල්ටුං සාමය යන්න දෙයාකාරයකට සංකල්පගත කර ඇත. ඒවා නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**දේශපාලන විද්‍යාව II**

**Political science II**

23 S II

පැය 03

**Time:03 hours**

**පහත සඳහන් ප්‍රශ්න 9 න් ඕනෑම ප්‍රශ්න 05 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

01 දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර ඇති සම්බන්ධතාවය විභාග කරන්න. (ලකුණු 20)

02 පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක යහපත් හා අයහපත් ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03 ඕනෑම අධ්‍යන ප්‍රවේශ දෙකක් විභාග කරන්න. (ලකුණු 20)

04 ඕනෑම දේශපාලන මතවාද දෙකක් කෙටියෙන් විමසන්න. (ලකුණු 20)

05 ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

- i නිරාගමිකවාදය
- ii ජාතිකවාදය
- iii දේශපාලන පක්ෂ
- iv සිවිල් සමාජය
- v බලපෑම් කණ්ඩායම් (ලකුණු 20)

06 නූතන භෞමික රාජ්‍ය පිළිබඳ සාකච්ඡා කරන්න . (ලකුණු 20)

07 ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය සහ සමාජවාදී රාජ්‍ය මාදිලිය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යනයක යෙදෙන්න.

(ලකුණු 20)

08 රාජ්‍ය ස්වභාවය පිළිබඳව සමාජ සම්මුතිවාදී කරීකයින්ගේ දායකත්වය කවරාකාර ද? විමසන්න.(ලකුණු 20)

09 ලිංගිකත්වය ප්‍රමිතිකරණය කොට තිබේ. ස්ත්‍රීවාදය ඇසුරින් ගවේෂනය කරන්න. (ලකුණු 20)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

දෙවන වාර පරීක්ෂණය 2020 මාර්තු

දේශපාලන විද්‍යාව I
**Political science I**

**පිළිතුරු පත්‍රය** **12 ශ්‍රේණිය**

## A කොටස

| | | |
|---|---|---|
| 01 4 | 11 1 | 21 5 |
| 02 3 | 12 5 | 22 5 |
| 03 3 | 13 2 | 23 5 |
| 04 1 | 14 1 | 24 2 |
| 05 5 | 15 4 | 25 3 |
| 06 5 | 16 4 | 26 4 |
| 07 3 | 17 3 | 27 3 |
| 08 2 | 18 5 | 28 3 |
| 09 1 | 19 3 | 29 1 |
| 10 5 | 20 4 | 30 3 |

## B කොටස

31 1
- ★ ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාකාරී වීම
- ★ ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීම

2
- ★ මැතිවරණවලට සහභාගිවීම
- ★ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වීම

32 1
- ★ මැතිවරණ ව්‍යාපාර
- ★ ආණ්ඩුවේ ප්‍රතිපත්ති

2
- ★ යුද්ධය හා සාමය
- ★ ඡන්දදායකයන්ගේ චර්යාව

33 1
- ★ පාර්ලිමේන්තුව
- ★ අධිකරණය

2
- ★ දේශපාලන පක්ෂ
- ★ කැබිනට් මණ්ඩලය

34 1
- ★ තුලනාත්මක ප්‍රවේශය
- ★ දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය

2
- ★ විද්‍යාත්මක ප්‍රවේශය
- ★ ස්ත්‍රීවාදී ප්‍රවේශය

35 1 ඇරිස්ටෝටල්

2 ප්ලේටෝ

36 1
- ★ සමාජ විද්‍යාව
- ★ කලාව
- ★ සාහිත්‍යය
- ★ මානව විද්‍යාව

2
- ★ මනෝ විද්‍යාව
- ★ භූගෝල විද්‍යාව

| | | | | |
|---|---|---|---|---|
| 37 | 1 | ★ ජනතාව දේශපාලන වශයෙන් දැනුවත් කිරීම<br>★ ආණ්ඩුවේ කටයුතු සංවිධාන ගත කිරීම | | |
| | 2 | සමාජ කණ්ඩායම්වල දේශපාලන අරමුණු සම්පාදනය කිරීම | | |
| 38 | 1 | ★ ආශා කණ්ඩායම්<br>★ ලෝබී කණ්ඩායම් | 2 | අභිලාෂ කණ්ඩායම් |
| 39 | 1 | ඇරිස්ටෝටල් | 2 | මැකියාවලී |
| 40 | 1 | ★ නිශ්චිත දේශ සීමාව<br>★ ජාතික පදනම | 2 | ★ ආණ්ඩුව<br>★ ස්වාධිපත්‍යය |
| 41 | 1 | ★ නන්වැදෑරුම් නිදහස<br>★ සමානාත්මතාව | 2 | ★ බහුතරයේ පාලනය<br>★ මහජන පාලනය |
| 42 | 1 | අභ්‍යයන්තර | 2 | බාහිර |
| 43 | 1 | ★ ප්‍රාග් කොමියුනිස්ට් යුගය<br>★ වහල් යුගය | 2 | ★ වැඩවසම් යුගය<br>★ ධනේෂ්වර යුගය |
| 44 | 1 | ★ සම්භාව්‍ය ලිබරල්වාදය | 2 | ★ නූතන ලිබරල්වාදය<br>★ නව ලිබරල්වාදය |
| 45 | 1 | ★ භූ දේශපාලන පිහිටීම<br>★ කීර්තිය | | |
| | 2 | ★ ආරක්ෂාව<br>★ ආර්ථික සාධක<br>★ විවිධත්වය තුළින් ඒකීයත්වය ආරක්ෂා කිරීම | | |
| 46 | 1 | 1787 ට පෙර ඇමරිකා එක්සත් ජනපදය | | |
| | 2 | ★ ස්විට්සර්ලන්තය<br>★ එක්සත් එමීර් රාජ්‍යය | | |
| 47 | 1 | කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් වීම | 2 | හදිසි අවස්ථාවන්ට සාර්ථකව මුහුණදීමට හැකිවීම |
| 48 | 1 | සරල වර්ගීකරණය | | |
| | 2 | ★ කෘත්‍යවාදී වර්ගීකරණය<br>★ දේශපාලන වර්ගීකරණය | | |
| 49 | 1 | ★ සහමන්ත්‍රණය<br>★ මැදිහත්කරණය | 2 | ★ සාම ගිවිසුම<br>★ සාමය ගොඩනැගීම |
| 50 | 1 | නිශේධනීය සාමය | 2 | සාධනීය සාමය |


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers
• Model Papers
• Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440